බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගණකාධිකාරී තනතුර

බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගණකාධිකාරී තනතුර පුරප්පාඩුව පවතින බැවින් එම තනතුර සඳහා ද්විතීයන පදනම මත නිලධාරියකු පත්කර ගැනීමට අවශ්‍යව ඇති බව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මහින් යොමු කර ඇති බස්නාහිර පළාත් මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්ගේ අංක WP/MPR/ADM/10/40 හා 2024.04.04 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

02. ඒ අනුව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගණකාධිකාරී තනතුර සඳහා තාවකාලික පදනමින් පත්වීමට කැමති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් තම ආයතන ප්‍රධානියා මඟින් ඉල්ලීමක් බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත යොමුකරන ලෙස කාරුණිකව දන්වමි.

03. මේ සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු පහත සඳහන් දුරකථන අංකය ඇමතීම මඟින් ලබාගත හැකිය.

ජගත් පෙරේරා මහතා – 0112871353
සාමාන්‍යාධිකාරී, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

එස්. ආලෝකබණ්ඩාර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) (වැ.බ)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකතන : 011-2696211-13 (දිගුව 132/218) / 011-2698672
ෆැක්ස් : 0112693304
විද්‍යුත් ලිපිනය : d.acsd.pubad@gmail.com